# <u>කොවිඩ් 19 වෛරසය පවතින කාලය තුල අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන මහජන පැමිණිලි සම්බන්ධවයි</u>

කොවිඩ් 19 වෛරසය පවතින කාලය තුල අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයට අතින් ගෙනවිත් භාරදෙන සියළුම මහජන පැමිණිලි කාර්යාලයේ ස්ථාපනය කර ඇති එම පැමිණිලි සඳහා වෙන් කරන ලද <u>රතු පැහැති</u> පෙට්ටියට බහාලන ලෙස මෙයින් දන්වා සිටිමි.

තවද, ඉදිරිපත් කරනු ලබන ලිඛිත පැමිණිලි, අවශ්‍ය සියලු විස්තර සහිතව ඉදිරිපත් කරන ලෙසත් (ප්‍රශ්නගත නඩු අංකය, අදාල අධිකරණය ආදිය නිවැරදිව සඳහන් කරන ලෙසත්) දන්වා සිටිමි. අවශ්‍යතාවයක් ඇතිවුවහොත් සම්බන්ධ කරගතහැකි ඔබගේ දුරකථන අංකය නිවැරදිව සඳහන් කල යුතු වේ. ඉහත පරිදි ලිඛිතව පැමිණිලි ඉදිරිපත් කිරීමට අමතරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත තවදුරටත් වාචිකව කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් පමණක්, මෙහි පහත සඳහන් දුරකථන අංකය වෙත සඳුදා සහ අඟහරුවාදා දිනයන්හිදී පෙ.ව. 9.30ත් ප.ව.1.30ත් අතර දුරකථන ඇමතුමක් ලබා දී ඒ සඳහා කාල වේලාවක් වෙන්කර ගැනීමට ලියාපදිංචි වන ලෙස දන්වා සිටිමි.

මෙම පියවර ගෙන ඇත්තේ කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය උපදෙස් සහ නිර්ණායකයන් අනුව බව අවධාරණය කරනු ලබන අතර නැවත දැනුම් දෙන තුරු මේ අයුරින් අතින් ගෙනවිත් ඉදිරිපත් කරන මහජන පැමිණිලි සබැඳිව කටයුතු කල යුතු බව දන්වමි.

දුරකථන අංකය : 0112-432758

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2020 මැයි මස 13 වෙනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.